වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

සභාවට පරිත්‍යාග වශයෙන් දෙන ලද පසුගිය වසර 10 පුරාම සභාව විසින් භාවිතා කෙරුණු වාහන 4 සභාවට අයත්ව නොතිබුණි. එනමුත් ඒවායේ වටිනාකම් එකතුව වූ රු.1,211,040 මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වාහන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
----------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ රුපියල් මිලියන 2 කට තක්සේරු කරන ලද වැඩ යෝජනා ක්‍රමය යටතේ අන්නම්මාල් ප්‍රජා මධ්‍යස්ථානය පුනරුත්ථාපනය නිම කිරීම සඳහා සභා අරමුදලින් රු.369,050 ක අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එනමුත් එම මුදල මේ දක්වාම පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ඉන්වොයිසි නොලැබීම හේතුවෙන්, ඉකුත් දෙවසර සඳහා වූ ගෙවීම් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදනය කළ රු.58,455 ක්වූ මුදල මේ දක්වාම නිරවුල් කර නොතිබුණි.

1.3.4 අනුකූල නොවීම්

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158(1) වගන්තිය | 645,129 | දේපළ මත හිඟ තක්සේරු බදු ගෙවීම් පැහැර හැරී පුද්ගලයන්ට සභා ලේකම් විසින් වරෙන්තුවක් නිකුත්කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛය | | සභාවේ වාහන 12 ක් සඳහා වූ ඉන්ධන දහන වසරක කාලයක්ම පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) | 2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 දරන උතුරු පළාත් මුදල් චක්‍රලේඛය | | නිලධාරී 08 ක් වෙතින් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,387,662 වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.28,623,466 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 101,800 | - | 100,907 | 645,129 | 101,000 | - | 99,948 | 628,008 |
| (ii) කුලී | 3,542,800 | - | 4,769,807 | - | 3,026,800 | - | 5,518,639 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,627,900 | - | 1,452,349 | - | 1,665,000 | - | 1,315,818 | - |
| (iv)වෙනත් ආදායම් | 28,575,500 | - | 41,170,635 | 82,768,531 | 24,659,100 | - | 33,114,248 | 75,325,231 |
| එකතුව | 33,848,200 | - | 47,493,698 | 83,413,660 | 29,451,900 | - | 40,048,653 | 75,953,239 |

(ආ) වරිපනම් හා බදු අයකිරීම් උපලේඛන නිකුත් කර නොතිබු බැව් නිරීක්ෂණය වූ අතර, ඇස්තමේන්තු කළ ආදායම් හා රැස්කළ ආදායම අතර වූ වෙනස මත සමුච්චිත හිඟය තීරණය වී තිබුණි.

2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය තුළ අයකළ යුතු රු.645,129 ක්වූ හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙතින් රු.52,190,019 ක්වූ මුද්දර ගාස්තු දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳ සියලු කරුණු පාලනය කිරීම් සහ පරිපාලනය, සමාන්‍ය ජනතාවගේ සුබවිහරණය, පහසුකම්, සුභසාධනය සහ ආරක්‍ෂා කිරීම හා වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගත් කිරමලේ ප්‍රදේශය පිහිටි ස්ථානය පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I) දෛනික කසළ රැස්කිරීම් කැබලිකර හිඟ පස්වලින් වසා නොතිබුණි.

(II) මදුරුවන් සහ කීටයන් පැතිරීම සහ දුර්ගන්ධය වැළැක්වීම සඳහා මදුරුතෙල් ඉසීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(III) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ඝන අපද්‍රව්‍ය වෙන් නොකර බැහැර කර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්‍ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) සභාවට අයත් පුස්තකාල 4 ක සාමාජිකයන් 629 ක සාමාජිකත්ව වර්ෂිකව අලුත් කිරීමට සභාව අසමත්ව තිබුණි.

(ආ) ජනතාවගේ දිළිදුකම තුරන් කිරීම සඳහා වූ අතිගරු ජනාධිපතිතුමාගේ යෝජනාව අනුව, 2017 වර්ෂය දිළිදුබව තුරන් කිරීමේ වර්ෂය වශයෙන් ප්‍රකාශයට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ අයවැය මඟින් රු.75,000 ක් වෙන්කර තිබුණි. එනමුත් මෙම යෝජනා ක්‍රමය විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

සභාව විසින් මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොමැති බැව් විගණනයේදී නිරීක්‍ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 06 ක් විසින් නිම කළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වාර්ෂික සමීක්‍ෂණ මණ්ඩල

සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික සමීක්‍ෂණ මණ්ඩල වාර්තාව අනුව, අලුත්වැඩියා කළ යුතුව තිබූ භාණ්ඩ වට්ටෝරු අයිතම 03 වෙනුවෙන් සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4.2 නඩත්තු හා අලුත්වැඩියාවන් සිදුකිරීමට අසමත්වීම

හානියට පත් තත්ත්වයෙන් වූ පානීය ජල බවුසර 02 ක් අලුත්වැඩියා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4.3 වත්කම් භාරදීමට අසමත්වීම

සභාව විසින් භාවිතා කරන ට්‍රැක්ටර් 4 ක් සභාවට අයිතිව නොතිබුණි.

3.4.4 අක්‍රිය වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) උතුරු පළාතේ සභා නිශ්චිත අරමුදල් වලින් තෙලිප්පලේ ඉදිකරන ලද රු.3,694,656 ක් වටිනා සාප්පු සංකීර්ණය 2014 දෙසැම්බර් 15 දින සභාවට භාරදෙනු ලැබ අපේක්‍ෂිත කටයුත්ත සඳහා භාවිතයෙන් තොරව පසුගිය වසර 03 පුරාම අක්‍රියව පැවතිණි.

(ආ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් දෙන ලද අරමුදලින් වරුක්කලායිමිලාන් ප්‍රදේශයේ ඉදිකරන ලද රු.6,567,550 ක් වටිනා අපද්‍රව්‍ය හැසිරවීම් ගොඩනැගිල්ලක් 2016 දෙසැම්බර් 21 දින සභාවට භාරදෙනු ලැබ අපේක්‍ෂිත කටයුත්ත සඳහා යොදාගැනීමෙන් තොරව අක්‍රියව පැවතිණි.

3.5 ප්‍රසම්පාදනය

-----------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සභාව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.5.2 ක්‍රියාකාරී සැලැස්ම

------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව වාර්ෂික ක්‍රියාකාරීත්ව සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

----------------------------------

4.1 අයවැය පාලනය

---------------------

අයවැය ආදායම සහ තත්‍ය ආදායම අතර රු.893 සිට රු.12,421,892 ක් හෙවත් සියයට 0.87 සිට සියයට 52.36 දක්වාද අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.660 සිට රු.7,854,746 හෙවත් සියයට 0.17 සිට සියයට 11.98 දක්වාද පරාසයක් තුළ විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණ | දේපළ තක්සේරු බදු ලේඛනය, ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ලේඛනය, පුස්තකාල පොත් ලේඛනය, මිණුම්පත්‍රිකා ලේඛනය, ඉඩම් විකුණුම් මත බදු ලේඛනය සහ වාහන ලේඛනය නඩත්තු කිරීමට අසමත් වීම. |